## කාශ්‍යප කෙළේ කුමක් ද

පස්වැනි සියවස හා සියවස තව තවත් අධ්‍යයනය කරත් ම ඒ අප රටේ සිංහල ජාතිය සම්බන්ධයෙන් වැදගත් ම කාල පරිච්ඡේදය නොවේ නම් වැදගත් ම කාල පරිච්ඡේදයක් බව පෙනී යයි. පඬුඅබා රජු දවස සිංහල ජාතිය ගොඩනැගීම ආරම්භ විය. දේවානම්පිය තිස්ස රජු දවස මෙරටට නිල වශයෙන් බුදුදහම හා අශෝක සංස්කෘතිය ලැබිණි. එහෙත් මෙරට අශෝක සංස්කෘතිය නොවන වෙනම ම සිංහල බෞද්ධ සංස්කෘතියක් ඇතිවිණි. ඉන්පසු ගැමුණු රජු දවස මෙරට සිංහල බෞද්ධ රාජ්‍යයක් ගොඩනැගිණි. එසේ වුවත් යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් වැඩි පිරිසක් (ඉතා වැඩි පිරිසක් විය හැකි ය) සිංහල ජාතියට එකතු වී නැත. ගැමුණු රජු මාගම සිට අනුරාධපුරයට පැමිණීමේ දී බිඳ දමන ලද බළකොටු තිස්දෙක දෙමළ බළකොටු නොව යක්ෂ බළකොටු යැයි සිතමු.

ගැමුණු රජුගෙන් පසුව මහසෙන් රජු දවස යක්ෂ ගෝත්‍රිකයන් යම් තරමකට බලවත් වී ඇති බව පෙනෙයි. මේ කාලයෙහි යක්ෂ රාජධානි මෙරට තිබිණි ද යන්න දැනගැනීමට මහාවංසයෙන් උපකාරයක් නො ලැබෙයි. ඒ සඳහා දැනට පුරාවිද්‍යාත්මක සාධක ඇතැයි සිතිය නො හැකි ය. එයට ප්‍රධාන හේතුව සාධක යන්න අර්ථනිරූපණය වන්නේ පවත්නා මතවාද අනුව වීම ය. සාධක යනුවෙන් වාස්තවික දත්ත නැත. සෑම සාධකයක් ම යම් මතවාදයක් පසුබිම් කරගනියි. අද සිහිගිරිය හෙවත් සීගිරිය යක්ෂ සංස්කෘතියට අයත් ලෙස අර්ථනිරූපණය නො වෙයි. අද පවත්නා අධිපතිවාදී මතවාදය අනුව එකල මෙරට යක්ෂ ගෝත්‍රිකයක් බලයක් තිබී නැත. එබැවින් සිහිගිරිය යක්ෂ සංස්කෘතියට අයත් යැයි සාමාන්‍යයෙන් නො සැලකෙයි.

අද යාපනයේ ජීවත්වන දෙමළ ජනයා සියවස් ගණනක් තිස්සේ මෙරට ජීවත්වන බව සිංහලයන් අතර ද ඇති අධිපති මතවාදය වෙයි. එයට එක් හේතුවක් වී ඇත්තේ දෙමළ ජනකායක් ඈත අතීතයේ සිට මෙරට ජීවත් ව ඇති බවට අපේ වංසකතාවලින් ද ව්‍යංගයෙන් කියනු ලැබීම ය. ගැමුණු රජු දවස සිටි දෙමළ ජනයා ගැන අපට ඉගැන්වෙයි. ඉන්පසුව ද විටින් විට දෙමළ ආක්‍රමණ වූ බව පැවසෙයි. මේ කතාවලින් අඛණ්ඩ දෙමළ ඉතිහාසයක් ගැන සෘජුව නොකියවෙතත් සිංහලයෝ ද දිගින් දිගට ම දෙමළ ඉතිහාසයක් තිබිණි යැයි සිතති.

එහෙත් ඓතිහාසික කරුණු මත පදනම් වී යාපනය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ පළමු මහාචාර්යවරයා වූ කේ ඉන්ද්‍රපාල මහතා අධිපති මතවාදයෙන් බැහැර වී මෙරට දොළොස්වැනි සියවසට පෙර ස්ථිර දෙමළ වාසස්ථාන නොතිබිණි යැයි කී විට දෙබරයට ගල් ගැසිණි. ඒ මහතා ඊනියා ඓතිහාසික සාධක සලකා බැලීමේ දී අධිපති මතවාදය සංගත නොවන බව තේරුම් ගන්නට ඇත. (පසුව ඒ මහතා දෙමළ ජාතිවාදයේ බලපෑම මත තම මතය වෙනස් කර ගත්තේ ය) එසේ වුවත් ඉන්ද්‍රපාල මහතාගේ මතය ඉතිගාසඥයන් අතළොස්සකට පමණක් සීමා විය. අධිපති මතවාදය වූයේ අඩු තරමින් එළාර යුගයේ සිට දෙමළ ජනයා මෙරට පදිංචි වී සිටි බව ය. අද ද සිංහලයන් ඉතා වැඩි පිරිසක් අතර ඇති මතවාදය ද එය වෙයි.

අපි ඉන්ද්‍රපාලන් මතය තව තවත් පෝෂණය කෙළෙමු. අද යාපනයේ දෙමළ ජනයාගේ ඉතිහාසය අවුරුදු තුන්සිය පනහකට ඈතට නොයන බව කියමු. අප එසේ කියන්නේ පවතින අධිපති මතවාදය ප්‍රතික්ෂේප කරමින් යාපනයේ හා තමිල්නාඩුවේ කතාකරන දෙමළ පිළිබඳ ව ඇති  ඇතැම් අදහස් සහ වෙනත් කරුණු ද උපයෝගී කරගනිමිනි. එහෙත් අපේ මතවාදය තවම පළල් වශයෙන් පිළිගැනී නොමැත. පරම්පරා ගණනාවක් තිස්සේ මිනිසුන් පිළිගෙන ඇති මතයක් වෙනස්කිරීම පහසු නැත. ඒ සඳහා දේශපාලන  බලයක් ද යම් ප්‍රමාණයකට වුව ද අවශ්‍ය වෙයි.

ප්‍රභාකරන් පරාජය කළ හැකිය හා පරාජය කළ යුතු ය යන මතවාදය ලිපි ලේඛන හා සම්මන්ත්‍රණ ඔස්සේ ඉදිරිපත් වුවත් යම්කිසි පිරිසක් ඒ සමග එකග වුවත් ජනතාව පළල් වශයෙන් ඒ පිළිගත්තේ ප්‍රායෝගික ව ඒ කළ හැකි දේශපාලන නායකත්වයක් ලැබීමෙන් පසුව ය. ප්‍රභාකරන් අනභිබවනීය යන මතය සමාජයේ අධිපති මතවාදය ව පැවතියේ එක් පරම්පරාවක කාලයකට අඩු කාලයක ය. එවැනි සුළු කලක් පැවති මතවාදයක් පවා පරාජය කිරීම පහසු කටයුත්තක් නො වී ය. එබැවින් පරම්පරා ගණනාවක් තිස්සේ ජනතාව විශ්වාස කළ මතයක් අවුරුදු දහයකින් පහළොවකින් පරාජය වේ යැයි නොසිතිය යුතු ය.

© Prof. Nalin De Silva

මෙරට අතීතයේ සිට ඇති දෙමළ සංස්කෘතියක් ගැන කීමට බොහෝ දෙනාට හැකි වී ඇත්තේ සිංහලයන්ගේ වංසකතාවලට ම පින්සිදු වන්නට ය. සිංහල වංසකතා සාහිත්‍යයෙන් යක්ෂ ගෝත්‍රික ඉතිහාසය ද සංස්කෘතිය ද පිටමං කෙරී ඇති අතර දෙමළ හා වෙනත් දකුණු භාරතීය ආක්‍රමණ විස්තර කෙරී ඇත. දෙමළ ජනයා ආක්‍රමණවලින් පසුව මෙරට පදිංචි වූ බවට සාධක නැතත් ජනතාව එසේ සිතනන්නට පෙළඹී ඇත. ඒ හේතුවෙන් යක්ෂ ගෝත්‍රික සංස්කෘතික ලක්ෂණ දෙමළ සංස්කෘතික ලක්ෂණ ලෙස ඇතැම් විට අර්ථකථනය කෙරෙයි. විශේෂයෙන් ම මෙරට ඇති අනාර්ය සංස්කෘතික වස්තු දෙමළ හා සාධාරණ (සාමාන්‍ය, පොදු යන අර්ථයෙන්) වශයෙන් ද්‍රවිඩ සංස්කෘතික වස්තු ලෙස " හඳුනාගැනීමේ" ප්‍රවණතාවක් වෙයි. පොම්පරිප්පුව වැනි තැන්වල ඇති පැරණි සුසානභූමි එලෙස ද්‍රවිඩ ලෙස හැඳින්වෙන භූමි බවට පත් වෙයි.

අපේ ඉතිහාසය මුළුමනින් ම මෙන් සකස් වී ඇත්තේ මහාවංසයේ හා වෙනත් වංසකතාවල ලියැවී ඇති කතා ජනප්‍රවාදයෙහි කතා හා පුරාවස්තු මත ය. බ්‍රිතාන්‍යයන් හා අනෙක් යුරෝපීයයන් මෙරටට පැමිණීමට පෙර ඒ කතා අර්ථකථනය කෙරුණේ සිංහල බෞද්ධ සංස්කෘතියක ය. ඒ සංස්කෘතියෙහි යක්ෂ ගෝත්‍රිකයනට ලබා දිය යුතුව තිබු තැන ලබා නොදුන් බැවින් හා දෙමළ ජනතාව විශාල වශයෙන් මෙරට පදිංචි වී නොසිටි බැවින් යක්ෂ සංස්කෘතිය අමතක කර දෙමළ ජනතාව අවුරුදු දහස් ගණනක් තිස්සේ මෙරට පදිංචි වී සිටි බවට කෙරුණු අර්ථකථනය සිංහලයන්ට එතරම් ප්‍රශ්නයක් නො විණි.

එහෙත් යුරෝපීයයන්ගෙන්, විශේෂයෙන් ම බ්‍රිතාන්‍යයන්ගෙන් වංසකතාවලට කෙරුණේ වෙනත් ම අර්ථකථනයකි. ඒ අර්ථකථනයෙහි ව්‍යංගයෙන් කියැවුණේ සිංහලයන්ගේ පැමිණීම ලෙස හැඳින්වෙන විජයගේ පැමිණීම සිදුවන කාලයෙහි මෙරට විසූ අනාර්යයන් දෙමළ බව ය. යක්ෂ ගෝත්‍රිකයන් යනු දෙමළ නොවන අනාර්ය ජනවර්ගයක් බව බ්‍රිතාන්‍යයෝ ද පසු කලෙක දෙමල ජාතිවාදී ඉතිහාස ලියූ සිංහල බෞද්ධ විරෝධී ඉතිහාසඥයෝ ද අමතක කළහ. භාරතයේ (අද පකිස්ථානයේ ඇති) මොහෙන්ජදාරෝ හරප්පා සංස්කෘතීන් ද්‍රවිඩ බව පෙන්වීමට තැත්කළ බ්‍රිතාන්‍යයෝ ආර්යයන් දඹදිවට පැමිණ ද්‍රවිඩයන් දකුණට තල්ලු කළ නබ පැවසීමට උත්සාහ කළහ.

බ්‍රිතාන්‍යයන්ට අවශ්‍ය වූයේ ද්‍රවිඩයන් දඹදිව මුල් පදිංචිකරුවන් බව පෙන්වීම ය. එයට හේතුව වූයේ ද්‍රවිඩයන් විශේෂයෙන් ම දෙමළ ජනවර්ගය බ්‍රිතාන්‍යයන්ගේ සුවච කීකරු සේවකයන් වීම ය. බ්‍රිතාන්‍යයන්ට දෙමළ ජනයා පාලනය කිරීම පහසු විය. බ්‍රිතාන්‍යයන්ගෙන් ඉන්දියාව නිදහස ලැබීමේ දී පළමුව වෙනම රාජ්‍යයක් ඉල්ලුවේ දෙමළ ජනයා බව අමතක නොකළ යුතු ය. මුස්ලිමුන් වෙනම රාජ්‍යයක් ඉල්ලා සිටියේ ඉන් පසුව ය. ලංකාවේ ද බ්‍රිතාන්‍යයන්ට අවශ්‍ය කෙළේ සිංහලයන්ට පෙර දෙමළ ජනයා මෙරට පදිංචි වී සිටි බව ය. එහෙත් පසුව අනාවරණය වූයේ ද්‍රවිඩයන් භාරතයට පැමිණ ඇත්තේ ක්‍රිස්තු පූර්ව හයවැනි සියවසේ පමණ බවත් ඒ වන විට අප විසින් අර්ධ වෛදිකයන් ලෙස හැඳින්වෙන්නන් ලංකාවට සංක්‍රමණය වී අවසන් බවත් ය.

අද අප කරන්නේ වංසකතාවල ලියැවී ඇති කරුණු හා වෙනත් ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක එකතු කරමින් වත්මන් සිංහල බෞද්ධ සංස්කෘතියට සාපේක්ෂව ඉතිහාසයට වෙනත් අර්ථකථනයක් කිරීම ය. ඒ අර්ථකථනය සංගත විය යුතු බව අමතක නොකළ යුතු ය. අප යෝජනා කරන්නේ එක් අතකින් ගත්කල සුසමාදර්ශී වෙනසකි. මෙතෙක් තිබූ සුසමාදර්ශයෙහි යක්ෂ ගෝත්‍රිකයන් ප්‍රධාන වන්නේ විජය රජු මෙරටට පැමිණි සමයෙහි දී පමණ ය. ඉන් පසු ඉතිහාස කතාවෙහි යක්ෂ ගෝත්‍රිකයන් ගැන කියැවෙන්නේ අතිරේක කතා ලෙස ය. එහෙත් වැව පදනම් කරගත් යක්ෂ සංස්කෘතිය විසින් මෙරට ප්‍රධාන සංස්කෘතියක් ලෙස ඉතා සාර්ථකව අර්ධ වෛදිකයන්ගේ ගංගා නිම්න සංස්කෘතිය පරාජය කෙරී ඇති බව පැහැදිලි ය.

යක්ෂ ගෝත්‍රිකයෝ කෘෂිකාර්මික ආර්ථිකයක් සහ සංස්කෘතියක් නිර්මාණය කළහ. ඒ සංස්කෘතිය වෙනත් කෘෂිකාර්මික සංස්කෘතීන්ගෙන් වෙනස් වන්නේ ඒ වාපී සංස්කෘතියක් වීමෙනි. සිංහලයන්ගේ සංස්කෘතික අනන්‍යතාවෙන් ඉතා වැඩි කොටසක් වැවත් කෘෂිකර්මාන්තයත් හා සම්බන්ධ ය. ඒ අරුතින් හා තවත් බොහෝ කරුණු අතින් ගත්කල සිංහලයන්ගේ සංස්කෘතියෙහි ප්‍රධාන සංරචකය යක්ෂ යැයි කිව හැකි ය. අද අපට ඇත්තේ යක්ෂ සංස්කෘතියක් මත අශෝක ථෙරවාද බෞද්ධ සංස්කෘතිය ආරෝපණය කිරීමෙන් ලබාගත් සංස්කෘතියකි. අවශ්‍ය නම් එය යක්ෂ

© Prof. Nalin De Silva

සංස්කෘතියට අශෝක සංස්කෘතිය අවශෝෂණය කිරීමෙන් ලබාගත් සංස්කෘතියක් යැයි කිව හැකි ය. එක් අතකින් ගත්කල වැවයි දාගැබයි යනුවෙන් හැඳින්වෙන්නේ මේ මිශ්‍රණයයි.

අපට ප්‍රධාන ප්‍රශ්නය වන්නේ යක්ෂ ගෝත්‍රිකයන්ගේ බලය ආර්ථික, සංස්කෘතික හා දේශපාලන ක්ෂෙත්‍රවල නැතිවූයේ කෙසේ ද හා කෙදිනක ද යන්න ය. ඒ පඬුඅබා කල නම් නොවන බව මේ වන විට පැහැදිලි ය. පඬුඅබාට සහාය දී ඇත්තේ යක්ෂ ගෝත්‍රයට අයත් යම් පිරිසක් පමණ ය. වැඩි පිරිසක් ඔහුට සහාය දී නැත. අර්ධ වෛදිකයන් සමග ගැටෙමින් තම අනන්‍යතාව රැකගනිමින් කාශ්‍යප කාලය දක්වා යක්ෂයන් ක්‍රමයෙන් බලවත් ව වැඩී ඇති බව පෙනෙයි. අද සීගිරිය හෙවත් සිහිගිරිය ගැන බොහෝ දෙනා ප්‍රවාද නිර්මාණය කරති. එහෙත් මේ ප්‍රවාද සියල්ල නිර්මාණය වන්නේ යක්ෂ සංස්කෘතිය අඩුම තරමින් පඬුඅබාගෙන් පසු අවසන් විණිය යන තේරුමෙනි. එහෙත් මේ අතර පඬුඅබා යක්ෂ යැයි කියන්නට උත්සාහ ගන්නෝ ද වෙති. ඒ නිරර්ථක උත්සාහයක් වන්නේ ඒ එසේ නම් ඉන්පසු යක්ෂ ගෝත්‍රිකයන් අභාවයට ගියේ කෙසේ ද යන්නට ඔවුන්ගෙන් නිසි පිළිතුරක් නො ලැබෙන බැවිනි.

අපේ ප්‍රවාද ඔස්සේ අප කරන අර්ථකථනය ඉතා පැහැදිලි ය. කාශ්‍යපගේ සීගිරිය යක්ෂ සංස්කෘතියෙහි විශිෂ්ට ඵලයකි. එකල යක්ෂ ගෝත්‍රියන්ට මෙරට විශාල බලයක් තිබිණි. ඒ කෙතරම් ද යත් යක්ෂ මවකගේ පුතකු වූ කාශ්‍යප රජුට තම පියා, එනම් සිංහල රජු, ඝාතනය කර රජ වීමට තරම් ශක්තියක් තිබිණි. සිංහල රාජ්‍යයේ උරුමය තිබූ මුගලන් කුමරුට භාරතයට පැන යැමට සිදුවිය. මහානාම හිමියන් බොහෝ කරුණු අධ්‍යයනය කර ධාතුසේන කුමරු රජකමට පුරුදු කළ ද ඒ රජු දෙමළ ආක්‍රමණිකයන් පරදවා ජයග්‍රහණය කළ ද යක්ෂ ගෝත්‍රිකයන් පරාජය කිරීමට එතුමාට නො හැකි විය. ඒ වෙනුවට මව් පාර්ශ්වයෙන් යක්ෂ ගෝත්‍රිකයකු වූ කාශ්‍යප කුමරු ධාතුසේන රජු මරා රජකමට පත්විය. ඒ පියා මැරීමක් ලෙස මහාවංසය කියයි. එහෙත් එය පිය රජු මරා දැමීමකට වඩා යක්ෂයන්ගේ සහාය දිනාගත් කාශ්‍යප රජු සිංහල රාජ්‍යයෙහි (අනුරාධපුරය අගනුවර කරගත්) ආධිපත්‍යය ලබාගැනීමක් ලෙස දැකිය හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva